සැ. යු.-- 2009.11.20 දින පළ වූ අංක 1,629 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,630 - 2009 නොවැම්බර් මස 27 වැනි සිකුරාදා - 2009.11.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1930 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1936 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 දෙසැම්බර් මස 04 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 නොවැම්බර් මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්‍ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

1927- B 080070 — 8835 (2009/11)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරින් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත් දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරින්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරින්ට අදාළ සේවා කොන්දේසි :**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලටද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහූ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරින්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරින්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්විමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරින් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හරිණු ලැබූ යුද්, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාව යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය :**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේව මුක්ත හටයින් ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එස සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරිහු :**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූ ද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැනට ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම :**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය :**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.

ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.

iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.

vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටි. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යන්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුට ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාව යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුසණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කැළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තිරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මාතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්‍ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65 ට වැඩි නොවිය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2009 දෙසැම්බර් මස 24 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 ඔක්තෝබර් මස 26 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මාතර | මාලිම්බඩ | තෙලිජ්ජවිල කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ වැලිගම් කෝරලය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර. |
| මාතර | වැලිපිටිය | උඩුකාව කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ වැලිගම් කෝරලය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර. |

11-619

---

## අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

කම්කරු විනිශ්චය සභා භාෂණ පරිවර්තක (සිංහල/දෙමළ) හා (සිංහල/ඉංග්‍රීසි) තනතුරු

අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ, කම්කරු විනිශ්චය සභා භාෂණ පරිවර්තක (සිංහල/දෙමළ) හා (සිංහල/ඉංග්‍රීසි) තනතුරු සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති පරිදි අවශ්‍ය සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *අධ්‍යාපන සුදුසුකම් :*

(අ) භාෂාව හා අංක ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ මූලික ගණිතය ඇතුළු යටත් පිරිසෙයින් විෂයයන් හතරකින් සම්මාන සාමාර්ථය සහිත ලංකා ජ්‍යෙෂ්ඨ/පාඨශාලා සහතික පත්‍ර විභාගය

*හෝ*

(i) සිංහල භාෂාව/දෙමළ භාෂාව
(ii) අංක ගණිතය හෝ ශුද්ධ ගණිතය
(iii) තවත් විෂයයන් හතරකින් එක් අවස්ථාවකදී විෂයයන් පහකට නොඅඩුවෙන්ද යටත් පිරිසෙයින් භාෂාව සහ ගණිතය විෂයයන් ඇතුළුව විෂයයන් හතරකින් සම්මාන සාමාර්ථය සහිතව විෂයයන් හයකින් ලංකා අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම.

*හෝ*

දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ සහ ගණිතය ඇතුළු විෂයයන් හතරකට 'බී' ශ්‍රේණියේ සාමාර්ථය සහිතව විෂයයන් 06 කින් ජා. පො. අ. සහතික පත්‍ර විභාගයෙන් සමත්වීම (සිංහල/දෙමළ හා ගණිතය ඇතුළුව එක් වරකදී විෂයයන් 05කට නොඅඩුවෙන් සමත්විය යුතුය) සහ

(ආ) (i) අයදුම්කරු සුදුසුකම් ලබා තිබෙන විභාගය සමත් වූ මාධ්‍යයට අමතරව වෙනත් භාෂා දෙකකින් (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) නිවැරදිව හා පැහැදිලිව කථා කිරීමට අයදුම්කරුවන් සමත්විය යුතුය)

(ii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් එක් එක් භාෂාවකින් (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) තවත් භාෂාවකට හෝ වැඩි ගණනකට භාෂණ පරිවර්තනය කිරීමේ හැකියාව තිබිය යුතුය.

03. *වයස් සීමාව* :- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ තනතුරු දරන අපේක්ෂකයන් කෙරෙහි මෙම උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.

04. වැටුප් පරිමාණය :

MN-1-2006 - ඒ (iv) පියවර 06
මාසිකව රු. 13,845-5 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320 - රු. 22,040

05. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය*.-අංක 15/90 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ ලේකම් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක හා වාචික පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතාව අනුව බඳවා ගැනීම සිදු කරයි.

1. *ලිඛිත පරීක්ෂණය*

**විෂය නිර්දේශය**

| | |
|---|---|
| සිංහල භාෂාව දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම<br>දෙමළ භාෂාව සිංහල භාෂාවට පරිවර්තනය කිරීම<br>සිංහල භාෂාව ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම<br>ඉංග්‍රීසි භෂාව සිංහල භාෂාවට පරිවර්තනය කිරීම | පැය 02 ක ප්‍රශ්න පත්‍රයකි. මුළු ලකුණු 100 |

2. *වාචික පරීක්ෂණය* - මුළු ලකුණු 50

ලිඛිත පරීක්ෂණයෙන් වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව 1:2 අනුපාතයට වාචික සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. වාචික සම්මුඛ පරීක්ෂණයේ දී වාචිකව පරිවර්තනය කිරීමේ හැකියාව මැන බලයි. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබයි. ලකුණු පරිපාටිය අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ ලේකම් විසින් තීරණය කරනු ලැබේ.

06. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) තෝරාගනු ලබන අපේක්ෂකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව ද දැනටමත් රාජ්‍ය සේවයේ තනතුර ස්ථිර කර ඇති අයෙක් නම් එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත්වද පත් කරනු ලැබේ.

(iii) සේවයට බැදී වසර 03ක් තුළ පළමු කාර්යක්ෂමතා කඩඉමද වසර 7ක් තුල දෙවන කාර්යක්ෂමතා කඩඉමද සමත් විය යුතුය.

07. *සේවා කොන්දේසි* :- ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්ති අදාල වේ.

08. මෙම නිවේදනයේ පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සම්පූර්ණකර, අයදුම්පත් 2009.12.18 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන්,

ලේකම්,
අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
උපරිමාධිකරණ සංකීර්ණය,
කොළඹ 12.
යන ලිපිනයට එවිය යුතුය.

09. ඉල්ලුම්පත එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "කම්කරු විනිශ්චය සභා භාෂණ පරිවර්තක තනතුර සඳහා අයදුම්පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය.

10. ඉල්ලුම්පත්‍රය සෑම ආකාරයකින්ම සම්පූර්ණ කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, ඉල්ලුම්පත්‍රය හෝ ඒ හා සම්බන්ධ ලිපි තැපෑලේදී නැති වූ බවට කරන පැමිණිලි සළකා බලනු නොලැබේ.

11. රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් සිය අයදුම්පත් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතුය.

12. යම් අයදුම්කරුවකුගේ අයැදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන හේතුවෙන් ඔහු/ඇය නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමටත් ඉඩ ඇත.

අධිකරණ අමාත්‍යංශ ලේකම්.

ලේකම්,
අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
කොළඹ 12.

### ආදර්ශ අයදුම්පත්‍රය

*අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය*

*කම්කරු විනිශ්චය සභා භාෂණ පරිවර්තක (සිංහල/දෙමළ) හා (සිංහල/ඉංග්‍රීසි) තනතුරු සඳහා අයදුම් පත්‍රය*

අංකය :————.
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

01. සම්පූර්ණ නම :
සිංහලෙන්/දෙමළෙන් :————. ඉංග්‍රීසියෙන් :————.
02. මුලකුරු සමග නම :
සිංහලෙන්/දෙමළෙන් :————. ඉංග්‍රීසියෙන් :————.
03. පුද්ගලික ලිපිනය :
සිංහලෙන්/දෙමළෙන් :————. ඉංග්‍රීසියෙන් :————.
04. කාර්යාලයීය ලිපිනය :————.
05. දුරකථන අංකය :————.
06. ජාතික හැඳුනුම්පත් අංකය :————.
07. උපන් දිනය :————.
08. 2009.10.31 දිනට වයස
අවු. :————., මාස :————., දින :————.
09. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
10. පුරවැසි භාවය :————.
11. ඉගෙනගත් භාෂා මාධ්‍යය :————.

12. අයැදුම් කරන්නේ භාෂණ පරිවර්තක (සිංහල/දෙමළ) තනතුර ද නැතහොත් (සිංහල/ඉංග්‍රීසි) තනතුරට ද යන වග :————.

13. අධ්‍යාපන සුදුසුකම් :

*අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය*

| *පාසල* | *විෂය* | *සාමාර්ථය* | *වර්ෂය* |
|---|---|---|---|
| | | | |

14. වෙනත් සුදුසුකම් :

15. මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සඳහන් කරන තොරතුරු සත්‍යවූත්, නිවැරදි වූත් ඒවා බැව් මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් වන බවත්, තෝරා පත් කිරීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දැන සිටිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

ඉල්ලුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත අයෙක් නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය 'ආ' කොටස (ආයතන ප්‍රධානියාගේ නිර්දේශය)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..................... මයා/මිය /මෙනෙවිය ............... දෙපාර්තමේන්තුවේ/අමාත්‍යාංශයේ/පළාත් සභාවේ ..................... වශයෙන් සේවය කරන බවත්, ඉහත දක්වා ඇති විස්තර නිවැරදි බවත්, ඔහුගේ/ඇයගේ වැඩ, පැමිණීම, හැසිරීම සතුටුදායක බවත්, මම සහතික කරමි. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/බලයලත්
නිලධාරියාගේ අත්සන.

නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

11-762

---

**වෘත්තීය සහ කාර්මික පුහුණු අමාත්‍යාංශය**

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ 1 පන්තියේ තනතුරු සහ තාක්ෂණ විද්‍යාල සඳහා අධ්‍යක්ෂ, අතිරේක අධ්‍යක්ෂ තනතුරු

වෘත්තීය සහ කාර්මික පුහුණු අමාත්‍යාංශය යටතේ වූ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ I පන්තියේ තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත අනුව සකස් කරන ලද අයදුම්පත් 2009.12.15 වැනි දිනට පෙර ලැබෙන සේ කොළඹ 05, නාරාහේන්පිට, ඇල්විටිගල මාවත, නිපුණතා පියස, අංක 354/2 හි වෘත්තීය සහ කාර්මික පුහුණු අමාත්‍යාංශයේ ලේකම් වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ I පන්තියේ තනතුරු සහ තාක්ෂණ විද්‍යාල සඳහා අධ්‍යක්ෂ, අතිරේක අධ්‍යක්ෂ තනතුරු" යනුවෙන් සඳහන් කළ යුතුය.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :-

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය, තෝරාගනු ලබන අයදුම්කරුවන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. තෝරාගනු ලබන අපේක්ෂකයින් දැනටමත් රජයේ සේවයේ ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන අයෙකු නොවන්නේ නම්, අවශ්‍යතාවයනට අනුකූලවන පරිදි පළමු වතාවට තුන් අවුරුදු පරීක්ෂණ/පරිවාස කාලසීමාවකට යටත්ව පත්කරනු ඇත. දැනටමත් රජයේ සේවයේ ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත් පළමුවතාවට ඔහුගේ/ඇයගේ පත්වීම එක් අවුරුදු වැඩ බැලීමේ කාලසීමාවකට යටත් කෙරෙනු ඇත.

(ii) මෙම තනතුරු සඳහා බඳවා ගනු ලබන නිලධාරින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව සේවයට බැඳී වසර 05ක් ඇතුලත දෙවන භාෂා ප්‍රවීනතාවය ලබා ගත යුතුය. එසේ එම කාලය තුල නියමිත භාෂා ප්‍රවීනතාවය ලබා ගැනීමට අපොහොසත් වන නිලධාරින්ගේ වැටුප් වර්ධක විලම්භනය කරනු ලැබේ. මෙම නිලධාරින් සඳහා භාෂා ප්‍රවීනතාවයන් වනුයේ අ. පො. ස. (සා. පෙළ.) විභාගයෙන් සිංහල/දෙමළ ප්‍රධාන විෂයයන් ලෙස සමත්වීම (දෙවන භාෂාව හෝ වෛකල්පිත විෂයයක් වශයෙන් නොවේ) හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වන කථන විභාගයකින් සමත්වීම හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පවත්වන විශේෂිත කුසලතා විභාගයෙන් සමත් වීම.

03. *වැටුප් හා දීමනා.*—මෙම පළමු පන්තියට අදාල වැටුප් පරිමාණය (SL -1-2006) අනුව රු. 22935-10x645-8x790-17x1050-53555 වන අතර, මාසික ආරම්භක වැටුප් පියවර 36,755ක් වේ.

04. අවශ්‍ය සුදුසුකම් :

සෑම අයදුම්කරුවෙකුම අයදුම්පත් භාරගන්නා 2008.07.18 දිනට පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4.1 විශිෂ්ඨ චරිතයකින් සහ මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත වීම.

4.2 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 30ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි බව (දැනටමත් රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයෙහි නියුක්ත වූවන්ට මෙම උපරිම වයස් සීමාව බලපාන්නේ නැත)

4.3 (i) පශ්චාත් උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතිකයක් හෝ සමාන සුදුසුකම්; සහ

(අ) ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ II පන්තියේ යටත් පිරිසෙයින් එක් වසරක සතුටුදායක* සේවා කාලයක් සම්පූර්ණකොට ඇත්තාවූද, තම තනතුරෙහි ස්ථිර කරනු ලැබ ඇත්තාවූද අයකු විය යුතු ය.

*නැතහොත්*

(ii) පශ්චාත් උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතිකයක් හෝ සමාන සුදුසුකම්; සහ

(ආ) වෘත්තීය සහ කාර්මික පුහුණු අමාත්‍යාංශය හෝ අමාත්‍යාංශය යටතේ ඇති කවර හෝ ආයතනයක 06/2006 වැටුප් චක්‍රලේඛයේ අනුව SL 1 වැටුප් පරිමාණයේ හිමි තනතුරක් දරමින් එම තනතුරෙහි ස්ථිර කරනු ලැබ ඇත්තාවූ ද, 2008.07.18 දිනට රු. 30,965කට නොඅඩු මාසික වැටුපක් ලබමින් සිටින්නා වූ ද, අයකු විය යුතුය.

*නැතහොත්*

(iii) ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ II පන්තියේ යටත් පිරිසෙයින් පස් වසරක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකොට ඇත්තා වු ද, තම තනතුරෙහි ස්ථිර කරනු ලැබ ඇත්තා වු ද අයකු විය යුතුය.

* සතුටුදායක සේවා කාලයක් යනුවෙන් අදහස් කරනුයේ පසුගිය වර්ෂ 05 තුළ සියලුම වැටුප් වර්ධක නියමිත පරිදි උපයාගෙන තිබීම හා අවවාද කිරීමක් හැරුණු විට වෙනත් විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම වේ.

05. පහත සඳහන් ලියවිල්ලක් හෝ සියල්ල හෝ අවශ්‍ය විටක ඉදිරිපත් කිරීමට සෑම ඉල්ලුම්කරුවෙකුම සුදානම් විය යුතු ය.

(අ) උප්පැන්න සහතිකය; (සැ. යු. - අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතිස්ම සහතික භාරගනු නොලැබේ.)
(ආ) උපාධි සහතික හෝ වෙනත් අධ්‍යාපනික සහතික;
(ඇ) චරිත සහතික දෙකක්;
(ඉ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික
(ඊ) සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවලින් සමත් ඉහළම විභාග සහතික.

සටහන :- i. කිසිම ලියවිල්ලක් හෝ ලියවිල්ලක පිටපතක් හෝ ඉල්ලුම්පත්‍රයට අමුණා නොඑවිය යුතුය.
ii. ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවක ඒවා ඉදිරිපත් කළ නොහැකි වන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

06. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින් විසින් ස්වකීය ඉල්ලුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා දිනට පසුව ලැබෙන අයදුම්පත් පිළිබඳ සලකා බලන්නේ දෙපාර්තමේන්තුව විසින් නියමිත දිනට පෙර ලැබී ප්‍රමාදයට පිළිගත හැකි කරුණු නිර්දේශ කරන්නේ නම් පමණි.

07. ඉල්ලුම්පත්‍ර සහ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි වෘත්තීය සහ කාර්මික පුහුණු අමාත්‍යාංශයේ ලේකම්ගේ නිල ලිපිනයට හැර වෙනත් කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොඑවිය යුතුය.

08. මෙම ගැසට් පත්‍රයේ I කොටස II අ ඡෙදයේ ආරම්භයේ පළකර ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාළ වන්නාවූ පොදු කොන්දේසි කෙරෙහි සහ 1986.08.15 වැනි දින පළ කරන ලද අංක 415 දරන රජයේ ගැසට් පත්‍රයේ "I කොටස (I) වැනි ඡෙදය - සාමාන්‍ය" හි නිවේදනය කරන ලද ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ ව්‍යවස්ථාවට හා වරින් වර කරන ලද සංශෝධන කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

09. ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ ව්‍යවස්ථාවට අනුකූලව ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ I පන්තියේ පත්වීම් කරනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුවය. ලකුණු දෙනු ලබන්නේ කුසලතාවය මෙන්ම ජ්‍යෙෂ්ඨතාවය මතය.

තිලක් හපන්ගම,
ලේකම්,
වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය.

වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය,
අංක 354/2, නිපුණතා පියස,
ඇල්විටිගල මාවත, නාරාහේන්පිට
කොළඹ 05.

ආදර්ශ අයදුම්පත්‍රය

(A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරගත යුතුය)
වෘත්තීය සහ කාර්මික පුහුණු අමාත්‍යාංශය යටතේ වන කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ I පන්තියේ තනතුරු සහ තාක්ෂණ විද්‍යාල සඳහා අධ්‍යක්ෂ, අතිරේක අධ්‍යක්ෂ තනතුරු

1. නම (මුලකුරු සමග) :————.
2. සම්පූර්ණ නම :————.
3. කාර්යාලීය ලිපිනය :————.
4. පෞද්ගලික ලිපිනය හා දුරකථන අංකය :————.
5. (අ) ශ්‍රී ලාංකිකයෙකු ද යන වග :————.
(ආ) එසේ නම් පරම්පරාවෙන් ද, ලියාපදිංචි වීමෙන් ද යන වග :————.
6. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
7. උපන් දිනය :————.
වර්ෂය :————. මාසය :————. දිනය :————.
8. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස
අවුරුදු :————. මාස :————. දින :————.
9. දැනට දරන තනතුර පිළිබඳ විස්තර :
(අ) තනතුර හා පත්වීමේ දිනය :————.
(ආ) ස්ථිර ද තාවකාලික ද යන වග :————.
(ඇ) විශ්‍රාම වැටුප් සහිත ද යන වග :————.
(ඈ) තනතුරෙහි ස්ථිර කර ඇති ද යන වග :————.
(ඉ) දෙපාර්තමේන්තුව :————.
(ඊ) ආයතනය/සේවා ස්ථානය :————.
(උ) වාර්ෂික ඒකාබද්ධ වැටුප් පරිමාණය :————.
(ඌ) දැනට ලබන වාර්ෂික ඒකාබද්ධ වැටුප :————.
10. අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ විස්තර :-
(උපාධි හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමා හා පශ්චාත් උපාධි)

| *ආයතනය/ විශ්වවිද්‍යාලය* | *උපාධිය/ පශ්චාත් උපාධිය* | *වර්ෂය* | *විෂයයන්/ ක්ෂේත්‍රය* |
|---|---|---|---|
| | | | |

11. වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර

| *සහතිකය* | *සහතිකය නිකුත් කළ ආයතනය* | *වර්ෂය* | *විෂයයන්/ ක්ෂේත්‍රය* |
|---|---|---|---|
| | | | |

12. ද්විතිය අධ්‍යාපන සුදුසුකම් ඃ

| *අ. පො. ස. (සා. පෙ.) විභාගය* | *වර්ෂය* | *විෂයයන්* | *සාමාර්ථය* |
| --- | --- | --- | --- |
| | | | |

| *අ. පො. ස. (උ. පෙ.) විභාගය* | *වර්ෂය* | *විෂයයන්* | *සාමාර්ථය* |
| --- | --- | --- | --- |
| | | | |

13. වෘත්තීය අධ්‍යාපනය ලද ආයතන

| *ආයතනය* | *පාඨමාලාව* | *සිට* | *දක්වා* |
| --- | --- | --- | --- |
| | | | |

14. කලින් දැරූ තනතුරු නිවැරදි දින දක්වමින් වකවානු පිළිවෙලින් සටහන් කරන්න.

| *තනතුර* | *ආයතනය* | *සිට* | *දක්වා* |
| --- | --- | --- | --- |
| | | | |

15. ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ නිලධාරියකු නම් කාර්යක්‍ෂමතා කඩඉම සමත්වී ඇති ද යන වග :
එසේ නම් ඃ (i) කාර්යක්‍ෂමතා කඩඉම සමත් වූ වර්ෂය :————.
(ii) ඒ සඳහා ලබාගත් සහතිකය :—————.

16. ඔබ යම්කිසි සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වරදකරුවී ඇත් ද ? :—————.

17. මීට පෙර රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ මණ්ඩලයක සේවයේ නියුක්තව සිටියේ නම් සේවයෙන් ඉවත්වීමට/ඉවත් කිරීමට හේතුව දක්වන්න. :—————.

18. ඔබට විරුද්ධව කිසියම් විනයානුකූලව පරීක්ෂණයක් පැවැත්වෙමින් තිබේ ද? (එසේ නම් විස්තර කෙටියෙන් දක්වන්න) :—————.

ම විසින් මෙම ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් කරන ලද තොරතුරු නිවැරැදි හා සත්‍ය බව සහතික කරමි. මෙම තොරතුරු අසත්‍ය බව, තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවත්, තෝරා ගැනීමෙන් පසු ඔප්පු වුවහොත්, කිසියම් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

—————.
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය :—————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

—————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :—————.

11-799

## කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය

### හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

පහත සඳහන් තනතුරු සඳහා නිසි අයුරින් සුදුසුකම් සම්පූර්ණ කළ ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ.

01. තනතුර ඃ ගණකාධිකාරි

i. *සුදුසුකම් හා පළපුරුද්ද* : වරලත් ගණකාධිකාරි ආයතනයේ ආශ්‍රිත සමාජිකත්වය හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනයේ (UK) සාමාජිකත්වය ලබා තිබීම හෝ එක්සත් රාජධානියේ වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සහතික ලත් ගණකාධිකාරිවරයෙකු වීම; සහ

ඉහත සුදුසුකම් ලැබීමෙන් අනතුරුව වසර 2ක සේවා පළපුරුද්ද, හෝ

ii. කළමනාකරණ පිළිබඳ උපාධිය සමග වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ අවසාන පරීක්ෂණයේ ප්‍රථම කොටස සමත් වී තිබීම හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරීත්ව ආයතනයේ (UK) මධ්‍ය පරීක්ෂණයෙන් සමත්වී තිබීම සහ ගණකාධිකාරිවරයෙකු වශයෙන් වසර 03 ක පළපුරුද්ද ලබා තිබීම.

2. වයස ඃ අවු 22-45

3. *කේත අංකය හා වැටුප් පරිමාණය.*— MM1-1 රු. 25,640 - 3 x 665 - 7 x 735 - 15x 925 - 46,655 (සුදුසුකම් හා පළපුරුද්ද අනුව සුදුසු වැටුප් තලයක පිහිටුවීම සම්බන්ධව සලකා බලනු ලැබේ). (මූලික වැටුප රු. 30,575 ඉක්මවා යාමේ දී මූල්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව හදාරා තිබිය යුතුය.)

02. තනතුර ඃ ප්‍රකාශන ඒකක ප්‍රධාන

1. සුදුසුකම් හා පළපුරුද්ද ඃ

(i) ඉංග්‍රීසි භාෂාව විෂයයක් වශයෙන් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් හදාරා තිබීම හෝ ජනසන්නිවේදන උපාධිය සමග අ.පො.ස. (උ/පෙල) විභාගයේ දී සිංහල/දෙමල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම; සහ

පිළිගත් ආයතනයක ප්‍රවෘත්ති හා ප්‍රකාශන සහ කළමනාකරණ කටයුතු පිළිබඳ දස වසරක පළපුරුද්ද

(ii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම සහ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරි තනතුරේ දස වසරක පළපුරුද්දක් ලබා තිබීම.

2. වයස ඃ 22- 45

3. *කේත අංකය සහ වැටුප් පරිමාණය.*— MM1-1 රු. 25,640 - 3 x 665 - 7 x 735 - 15 x 925 - 46,655

(සුදුසුකම් හා පළපුරුද්ද අනුව සුදුසු වැටුප් තලයක පිහිටුවීම සම්බන්ධව සලකා බලනු ලැබේ.) (මූලික වැටුප රු. 30,575 ඉක්මවා යන අවස්ථාවේ දී අදාළ නිලධාරියා ජනසන්නිවේදනය හෝ විෂය ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධියක් සපුරා තිබිය යුතුය.)

03. තනතුර ඃ පර්යේෂණ නිලධාරි

1. සුදුසුකම් සහ පළපුරුද්ද ඃ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ප්‍රථම හෝ දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සහිතව ආර්ථික විද්‍යාව, කෘෂිකර්මය, සංවර්ධන ආර්ථික විද්‍යාව, පාරිසරික ආර්ථික විද්‍යාව සංඛ්‍යානය සහ සමාජ විද්‍යාව යන විෂයයකින් ලබාගත් උපාධියක්;

හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉහත සඳහන් විෂයයක් හෝ විෂයයන් කිහිපයක් පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම සමග පශ්චාත් උපාධිය ලබා තිබීම; හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ වසර 08 ක පළපුරුද්ද සහ ශාස්ත්‍රීය ප්‍රකාශනයන්/ නිබන්ධනයේ විශිෂ්ඨ හැකියාව

2. වයස ඃ අවු 22- 45

3. *කේත අංකය සහ වැටුප් පරිමාණය* :— AR1-රු. 24,725 - 5 x 550 - 5 x 645 - 15 x 770 - රු. 42,250

(සුදුසුකම් හා පළපුරුද්ද අනුව සුදුසු වැටුප් තලයක පිහිටුවීම සම්බන්ධව සලකා බලනු ලැබේ.)

04. තනතුර ඃ ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරි (ඉංග්‍රීසි/සිංහල) (1 ශ්‍රේණිය)

1. සුදුසුකම් සහ පළපුරුද්ද ඃ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් සමාජ විද්‍යා විෂයය ක්ෂේත්‍රයෙන් ලබාගත් උපාධියක් සමග සිංහල/ඉංග්‍රීසි විෂයයක් වශයෙන් හදාරා තිබීම සහ වසර 05 ක අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද හෝ;

අ.පො.ස. (උ./පෙ.) විභාගයෙන් පැරණි විෂය නිර්දේශයට අනුව විෂයයන් 04 ක් සමත්ව තිබීම හෝ නව නිර්දේශයට අනුව විෂයයන් 03 ක් එකම අවස්ථාවක දී සමත්ව තිබීම සහ අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් තිබීම; සහ

පිළිගත් ආයතනයක ප්‍රවෘත්ති හා ප්‍රකාශන කාර්ය ක්ෂේත්‍රයේ අවම වශයෙන් 10 වසරක පළපුරුද්ද

2. වයස ඃ අවු 22-45

3. *කේත අංකය සහ වැටුප් පරිමාණය* :— JM1-2 - රු.20,890 - 10 x 365 - 18 x 550 - 34,440
(සුදුසුකම් හා පළපුරුද්ද අනුව සුදුසු වැටුප් තලයක පිහිටුවීම සම්බන්ධව සලකා බලනු ලැබේ.)

05. තනතුර ඃ සංඛ්‍යාන නිලධාරි

1. සුදුසුකම් සහ පළපුරුද්ද ඃ
පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් සංඛ්‍යානය හෝ අදාළ ක්ෂේත්‍රයේ උපාධියක් සමග වසර 05 ක පළපුරුද්ද

පරිගණක දැනුම අමතර සුදුසුකමක් වනු ඇත.

2. වයස ඃ අවු 22-45

3. *කේත අංකය සහ වැටුප් පරිමාණය* :— JM1-2 රු. 20,890 - 10 x 365 - 18 x 550 - 34,440

06. තනතුර ඃ දත්ත විශ්ලේෂක

1. සුදුසුකම් සහ පළපුරුද්ද ඃ
පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමග සංඛ්‍යාන මෘදුකාංග භාවිතා කරමින් දත්ත විශ්ලේෂණ කිරීම පිළිබඳ අදාළ ක්ෂේත්‍රයේ වසර 05 ක පළපුරුද්ද. පරිගණක පිළිබඳ දැනුම අත්‍යවශ්‍යය.

2. වයස ඃ 22-45

3. *කේත අංකය හා වැටුප් පරිමාණය* :— JM1-2 - රු. 20,890 - 10 x 365 - 18 x 550 - 34,440

07. තනතුර ඃ සංඛ්‍යාන සහකාර (iii ශ්‍රේණිය)

1. සුදුසුකම් සහ පළපුරුද්ද ඃ

සංඛ්‍යාන විද්‍යාව, ගණිතය, ආර්ථික විද්‍යාව, කෘෂිකර්මය, වාණිජ විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය/රාජ්‍ය පරිපාලනය විෂයයන් සහිතව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් තිබීම. උපාධිය සඳහා ගණිතය විෂයයක් වශයෙන් හදාරා නොමැති අයැදුම්කරුවන් අ.පො.ස. (උ/පෙ) විභාගයේ දී ගණිතය විෂය සඳහා සාමාර්ථ ලබා තිබිය යුතුය.

2. වයස ඃ අවු 22-45

3. *කේත අංකය සහ වැටුප් පරිමාණය* :— MA2-2 රු.14,610-10 x 145 - 7 x 170 - 4 x 290 - 20 x 345 - 25,310

අනෙකුත් වරප්‍රසාද ඃ

සේවක අර්ථ සාධක අරමුදල සඳහා ආයතනය මගින් 15%ක දායකත්වය දරන අතර සේවකයා 10% ක දායකත්වයක් දැරිය යුතුය. සේවකයාගේ මුළු වැටුපෙන් 3% කට සමාන මුදලක් සේවකයා වෙනුවෙන් සේවක භාරකාර අරමුදලට බැර කෙරේ. රාජ්‍ය සේවකයන් සඳහා වන ආදායම් බද්දෙන් වැටුප් නිදහස්වීම අදාළ වේ. ආයතන සේවකයන් සඳහා වෛද්‍යාධාර සැලසුමක් ක්‍රියාත්මක වේ.

ඉහත තනතුරු සඳහා වන වැටුප් වලට, අමතරව, රජයේ අනුමත ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.
දැනටමත් රජයේ/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල සේවාවන් හි සේවයේ නියුතු වූවන්ට ඉහත උපරිම වයස් සීමාව බල පවත්වනු නොලැබේ.

2010.01.15 දිනට ප්‍රථම නියමිත පරිදි සම්පූර්ණ කළ අයැදුම්පත්, උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික සහ පළපුරුද්ද සඳහන් සහතික සමග ලියාපදිංචි තැපෑලෙන් මා වෙත එවිය යුතුය.

අයැදුම් කරන තනතුර අයැදුම්පත බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය. රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල සේවයේ දැනටමත් නියුතුව සිටින්නන් විසින් තම ආයතන ප්‍රධානියා මගින් එවන අයැදුම්පත් පමණක් සලකා බලනු ලැබේ.

අධ්‍යක්ෂ,
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු,
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.

අංක 114, විජේරාම මාවත,
කොළඹ 07.

11-825

### අධිකරණ සේවා කොමිෂන් සභාව

### පහත උපලේඛනයේ සඳහන් ප්‍රදේශවල ක්වාසි තනතුරු සඳහා බඳවා ගැනීම පිණිස මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ (115 පරිච්ඡේදය) යටතේ අයදුම්පත් කැඳවීම

පහත සුදුසුකම් ඇති පුද්ගලයින්ට මේ සඳහා අයදුම් කලහැක. :—

අයදුම්කරු මුස්ලිම් පිරිමියකු වියයුතු අතර, පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියෙකු හෝ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද සහතිකයක් දරන මවුලවී කෙනෙකු හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අල් - ආලිම් සහතිකය දරන්නෙකු හෝ නීතිඥයෙකු හෝ ඊට සමාන වෘත්තීමය සුදුසුකම් දරන්නෙකු හෝ විශ්‍රාමික රජයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධරයෙකු විය යුතුය.

දැනට රජයේ සේවයේ නියුක්තකුට මේ සඳහා අයදුම් කල නොහැක.

අයදුම්කරුවන් වයස අවුරුදු 40ට වැඩි යහපත් චරිතයක් ඇති, මුස්ලිම් විවාහ සහ දික්කසාද පිළිබඳව විශේෂිත වූ ඉස්ලාම් නීතිය ගැන හොඳාකාර දැනීමක් ඇති සහ සමාජය තුළ යහපත් පිළිගැනීමක් ඇති විවාහකයකු විය යුතුය.

තෝරාගනු ලබන අපේක්ෂකයා පත්වීම් ලිපියේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් සඳහා පත්කරනු ලැබේ.

ක්වාසිවරයෙකු තමා පත්කරනු ලබන ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිව සිටීම නීතිමය වශයෙන් අවශ්‍යය.

ක්වාසිවරයකුට මසකට රුපියල් 6,000 ක දීමනාවකට අමතරව සහයක සේවාවන්, ලිපිද්‍රව්‍ය හා තැපැල් වියදම් සඳහා මසකට උපරිම රුපියල් 5,000 ක ගෙවීමක් කරනු ලැබේ.

අයදුම්පත් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය මගින් ලබාගත හැකි අතර, අයදුම්පත් 2009 දෙසැම්බර් මස 15 වැනි දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

එම්. පී. ද සිල්වා,  
අධිකරණ සේවා කොමිෂන් සභාවේ,  
*වැඩබලන ලේකම්.*

කොළඹ 12,  
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

#### උපලේඛනය

| | | |
|---|---|---|
| 01. හම්බන්තොට | : | හම්බන්තොට අධිකරණ කලාපයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි. |
| 02. ගම්පහ | : | ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ, අත්තනගල්ල, මීරිගම හා මහර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි. |
| 03. කෑගල්ල | : | කෑගල්ල අධිකරණ කලාපයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි. |
| 04. මීගමුව | : | මීගමුව අධිකරණ කලාපයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි. |

11-757

---

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය

### ශ්‍රවණවේදී කාර්මික ශිල්පී පුහුණුව සඳහා සිසුන් බඳවා ගැනීම - 2009

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ශ්‍රවණවේදී කාර්මික ශිල්පී පුහුණුවට සිසුන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලැබූ ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *අධ්‍යාපන සුදුසුකම් :*

1.1 *(අ)* අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය : සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වීම.

සහ

*(ආ)* අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ. පෙළ) විභාගය : භෞතික විද්‍යාව ඇතුළු විද්‍යා විෂයන් තුනකින් එකවර සමත් වීම.

1.2. *අනෙකුත් සුදුසුකම් :*

*(අ)* 2009.12.28 දිනට වයස අවුරුදු 18ට නොඅඩු, සහ 45ට නොවැඩි විය යුතුය.

*(ආ)* දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති විය යුතුය.

*(ඇ)* මනා ශාරීරික සෞඛ්‍යකින් යුක්ත විය යුතුය.

02. අපේක්ෂිත සුදුසුකම් සහිත අයදුම්කරුවන්හට තරග විභාගයක් පවත්වා ඉන් ඉහල ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීමෙන් අනතුරුව පුහුණුව සඳහා තෝරාගනු ලැබේ.

* *විභාග ක්‍රමය :*

*(අ)* විභාගය සිංහලෙන්, දෙමළෙන් හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ.

*(ආ)* අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය.

* *තේරීම් පරිපාටිය.-* එක් විෂයකින් සුදුසුකම් ලැබීම සඳහා 40% ක් හෝ ඊට වඩා ලබාගත යුතුය. මෙම විභාගයෙන් සුදුසුකම් ලැබුවන්ගෙන් වැඩිම ලකුණු ප්‍රමාණයලත් අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට කැඳවා සුදුසුකම් පරීක්ෂා කර බලනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දෙනු නොලැබේ. සුදුසුකම් සම්පූර්ණ කර අත්තාවූත්, විෂයයන් දෙකකින්ම උපරිම ලකුණු ගත්තාවූත්, අපේක්ෂකයින් පුහුණු කිරීමේ ශ්‍රේණියට පත් කිරීම සඳහා තෝරාගනු ලැබේ.

* *විභාගය සඳහා විෂයයන්.-* විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

| *විෂයය* | *කාලය* | *ලකුණු* |
|---|---|---|
| I. බුද්ධි පරීක්ෂණය | පැය 01යි | 100 |
| II. තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | පැය 01 1/2 යි | 100 |
| | එකතුව | 200 |

* *විෂය නිර්දේශය :*

I. බුද්ධි පරීක්ෂණය.- අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයත් තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.

II. තාක්ෂණ ප්‍රශ්න පත්‍රය.- තනතුරට අදාළ විෂය දැනුම.

03. මෙම පාඨමාලාව පූර්ණකාලීන පාඨමාලාවක් බැවින් සතියේ දින පහේ (5) සහ සෙනසුරාදා පෙරවරුවේ වෙනත් පාඨමාලාවක් හදාරන සිසුන් මෙම පාඨමාලාව සඳහා අයදුම් නොකළ යුතුය.

04. *පුහුණු කාලය.-* වසර 02 යි (මාස 06 ක ආයතනික පුහුණුව සහ කාර්යයේ නියුතුව වසර 1 1/2 යි).

05. අයදුම් කළ යුතු ක්‍රමය :

(අ) මේ සමඟ ඇති ආකෘති පත්‍රය අනුව අයදුම්පත් සකස් කර ගත යුතු වේ.

(ආ) *විභාග ගාස්තු.-* ලේකම්, සෞඛ්‍ය, ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය, "සුවසිරිපාය", අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. " යන ලිපිනයට ලියූ කොළඹ මහ තැපැල් කාර්යාලයෙන් ගෙවිය හැකි මුදල් ඇණවුමක් මගින් රු. 200 ක විභාග ගාස්තුව සෑම අපේක්ෂකයෙකු විසින්ම ගෙවිය යුතුය. විභාග ගාස්තුව කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ.

(ඇ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ/අධ්‍යාපන පරිපාලන සේවයේ/ රජයේ ගණකාධිකාරි සේවයේ/ රජයේ විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/ නීතිඥවරයෙකු හෝ වර්ෂයකට රු. 1,24,080 ට නොඅඩු වැටුපක් ලබන රජයේ නිලධාරියෙකු විසින් අපේක්ෂකයාගේ අත්සන සහතික කළ යුතුවේ.

(ඈ) අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර එය බහාලන කවරයේ වම් කෙළවරේ "ශ්‍රවණවේදී කාර්මික ශිල්පී අභ්‍යාසලාභීන් බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කොට 2009.12.28 දින හෝ ඊට පෙර "අධ්‍යක්ෂ (විභාග), සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය, "සුවසිරිපාය", අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. " යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

06. *විභාගයට පෙනීසිටීම.-* විභාගය පවත්වන දිනට සතියකට කලින් ලැබෙන සේ විභාග ප්‍රවේශපත්‍ර සෞඛ්‍ය ලේකම් විසින් නිකුත් කරනු ලැබේ. ඒ සම්බන්ධයෙන් නිවේදනයක් පුවත්පත්වල පළවන අතර, ඒ පිළිබඳව අයදුම්කරුවන් අවධානයෙන් සිටිය යුතුය. විභාගයේ දී අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(අ) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

07. ඒ වන විට ප්‍රවේශපත්‍ර නොලැබුණු අපේක්ෂකයින් පහත සඳහන් විස්තර සහිතව ඒ ගැන අධ්‍යක්ෂ(විභාග) වෙතින් විමසිය යුතුය. (දුරකථන අංකය : 0112679160).

(අ) විභාගයේ නම :—————.

(ආ) තෝරාගත් නගරය :—————.

(ඇ) ඉල්ලුම් කරන ලද දිස්ත්‍රික්කය :—————.

(ඈ) ඉල්ලුම්පත් ලියාපදිංචි කිරීමේ අංකය :—————.

(ඉ) මුදල් ගෙවන ලද රිසිට්පතේ අංකය :—————.

08. රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.

09. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

10. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

11. මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12. ඉහත අධ්‍යාපන සුදුසුකම් හා අනෙකුත් සුදුසුකම් සපුරා ඇති සහ තරඟ විභාගයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂක, අපේක්ෂිකාවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන්හට ඉදිරිපත් කරන ලෙස දන්වනු ලබන ලියකියවිලිවල මුල්පිටපත් ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී අවශ්‍ය සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

13. (අ) පුහුණුව සඳහා ඇතුළත් කරන අභ්‍යාසලාභීන් පුහුණු පාසල් වල බල පැවැත්වෙන නීති රීතිවලට හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත් වනු ඇත.

(ආ) පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ නියමිත විභාගවලින් අසමත්වන හෝ වැඩ හා හැසිරීම අසතුටුදායකවන හෝ තමන් ඇතුළත් කරනු ලබන පුහුණු පාසලෙහි විභාග හා නිවාඩු කොන්දේසි පිළිපැදීමට අපොහොසත්වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව නතර කිරීමට හැකිය.

(ඇ) පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ අභ්‍යාසලාභීන්ට දීමනාවක් ගෙවනු ලැබේ.

(ඈ) පුහුණු පාසල්වලට ඇතුළත්වන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, එකී පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණ කිරීමෙන් පසුව පත්වීම්

ලැබුනහොත් අවම වශයෙන් වසර 05 කාලපරිච්ඡේදයක් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සේවය කරන බවටත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ ජනරාල් සමග ගිවිසුමකට එළඹිය යුතුය. පුහුණුව ලබන කාලය තුළ පුහුණුවෙන් ඉවත් වුවහොත් හෝ පුහුණුව හැර ගියහොත් "ආ" ඡේදය අනුව පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවුවහොත් පුහුණු කාලය තුළ දී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව හා රජය විසින් දරන ලද වියදම් සඳහා වැය වූ මුදල ඔහු/ඇය විසින් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුවේ. එසේ නොවුවහොත් ගිවිසුම් ප්‍රකාරව එම මුදල අයකර ගැනීමට නිසි පියවර ගනු ලැබේ.

14. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන්.*—පුහුණුව අවසානයේ දී ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට රජය බැඳී නොසිටී. එහෙත් දිවයිනේ ඕනෑම පළාතක ඇතිවන පුරප්පාඩු මත අවසන් පරීක්‍ෂණයෙන් සමත්වන අපේක්‍ෂක/අපේක්ෂිකාවන්ට දෙපාර්තමේන්තුව මගින් ඔවුන් ලබා ඇති කුසලතාවය පදනම් කර ගනිමින් අදාළ තනතුරේ III වැනි පංතියේ ශ්‍රවණවේදී කාර්මික ශිල්පී තනතුර සඳහා පත්කරනු ලැබේ.

15. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර ඉල්ලුම්පත්‍ර පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුළත් කළ යුතුය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම ලැබීමෙන් පසු ඉහත කී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත් දෙනු ලබන පත්වීම් අවලංගු කර පුහුණුවෙන්/සේවයෙන් පහකරන අතර, නැවත රජයේ සේවයට නොගන්නාවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ඇයගේ නම ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.

16. තෝරාගත් අයදුම්කරුවන් අදාළ පාඨමාලාවන් හැදෑරීමට සහ ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික සහ මානසික වශයෙන් යෝග්‍යතාවයකින් හෙබි බවට සනාථ කරනු වස් වෛද්‍ය පරීක්‍ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්‍ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අපේක්‍ෂකයින් පුහුණු පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

17. ඉහත පරිදි බඳවා ගනු ලබන සියළුම අභ්‍යාසලාභීන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව මගින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, මුදල් හා වෙනත් රෙගුලාසිවලට ද, රජය විසින් වරින්වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ට ද යටත්වනු ඇත.

18. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම ගැසට් නිවේදනය මගින් ආවරණය නොවන යම් ගැටළු සහගත තත්වයක් උද්ගත වුවහොත් ඒ පිළිබඳව සෞඛ්‍ය ආරක්‍ෂණ හා පෝෂණ අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

වෛද්‍ය, එච්. ඒ. පී. කහඳලියනගේ,
ලේකම්,
සෞඛ්‍ය, ආරක්‍ෂණ හා පෝෂණ අමාත්‍යාංශය.

2009 නොවැම්බර් මස 10 වැනි දින.

ආදර්ශ අයදුම්පත්‍රය

*සෞඛ්‍ය ආරක්‍ෂණ හා පෝෂණ අමාත්‍යාංශය*

*ශ්‍රවණවේදී කාර්මික ශිල්පී පුහුණුව සඳහා බඳවා ගැනීම - 2009*

[ ]
(කාර්යාල ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින මාධ්‍ය :

[ ]

සිංහල - S
දෙමළ - T
ඉංග්‍රීසි - E

(අදාළ අක්‍ෂරය කොටුව තුළ ලියන්න)

විභාගයට ඉල්ලුම් කරන දිස්ත්‍රික්කය කැමැත්ත අනු පිළිවෙළ

| | |
|---|---|
| 01 | |
| 02 | |
| 03 | |

01. (අ) මුලකුරු සමග නම : ————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : ————.

(ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) : ————.

(ඈ) ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

02. (අ) ස්ථිර ලිපිනය :

| (සිංහලෙන්/දෙමළෙන්) | ඉංග්‍රීසියෙන් |
|---|---|
| ————. | ————. |
| ————. | ————. |
| ————. | ————. |
| ————. | ————. |

(ආ) ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය : ————.

03. (අ) ස්ත්‍රී/පුරුෂ භාවය :

ස්ත්‍රී - F
පුරුෂ - M [ ] (අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)

(ආ) උපන් දිනය :

වර්ෂය :——. මාසය :——. දිනය :——.

(ඇ) 2009.12.28 දිනට වයස : අවුරුදු :——. මාස :——.
දින :——.

04. (ආ) අධ්‍යාපන සුදුසුකම් : ————.

අ.පො.ස (සා.පෙළ) විභාගය පළමුවර :
විභාගයේ වර්ෂය : ————.
විභාග අංකය : ————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 01. | | 06. | |
| 02. | | 07. | |
| 03. | | 08. | |
| 04. | | 09. | |
| 05. | | 10. | |

අ.පො.ස (සා.පෙළ) විභාගය දෙවනවර :

විභාගයේ වර්ෂය : ————,

විභාග අංකය : ————,

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 01. | | 06. | |
| 02. | | 07. | |
| 03. | | 08. | |
| 04. | | 09. | |
| 05. | | 10. | |

(ආ) අ.පො.ස (උ.පෙළ) විභාගය :

විභාගයේ වර්ෂය : ————.

විභාග අංකය : ————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 01. | |
| 02. | |
| 03. | |
| 04. | |

05. වෙනත් සුදුසුකම් : ————.

06. ඔබට කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් දඬුවම් කරනු ලැබ තිබේ ද ?

ඔව් ☐ නැත. ☐

(අදාළ කොටුවේ '✓' යොදන්න.)

"ඔව්" නම් විස්තර සපයන්න. : ————.

07. විභාග ගාස්තු ගෙවන ලද ලදුපත පිළිබඳ විස්තර :

(අ) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය : ————.
(ආ) වවුචර් අංකය හා දිනය : ————.
(ඇ) ගෙවූ මුදල : ————.

08. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සතය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදු විය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද, මෙහි සියලු කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද, ප්‍රකාශ කර සිටිමි.

(ආ) ම විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම් ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

(ඇ) මෙම විභාගයේ කොන්දේසි සියල්ල පිළිපැදීමට එකඟ වෙමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..................... මයා/මිය./මෙනවිය. මා පෞද්ගලිකව හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ............... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————,

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————,

තනතුර :————,

ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

11-829

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.